# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1986 අංක 4 දරන
# ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනත

---

[සහතිකය සටහන් කළේ 1986 පෙබරවාරි මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදි.

---

1986 පෙබරවාරි මස 21 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 45 යි　　　　තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1986 අංක 4 දරන ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනත

[සහතිකය සටහන් කළේ 1986 පෙබරවාරි මස 18 වන දින.]

එල්. ඩී.—ඕ. 53/85

**හිටපු ජනාධිපතිවරයන්ට සහ හිටපු ජනාධිපතිවරයන්ගේ වැන්දඹුවන්ට නිල නිවාස සහ වෙනත් දීමනා සහ පහසුකම් ප්‍රදානය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද එවැනි වැන්දඹුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1986 අංක 4 දරන ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**නිවාස සැපයීම.**

2. සෑම හිටපු ජනාධිපතිවරයකුට ම සහ හිටපු ජනාධිපතිවරයකුගේ වැන්දඹුවකට ම ඔහුගේ හෝ ඇගේ ජීවිත කාලය තුළ වාසය සඳහා උචිත නිවාසයක් නිවාස කුලියෙන් තොරව සැපයිය යුතු ය:

එසේ වුවද යම්කිසි හේතුවක් නිසා ඒ හිටපු ජනාධිපතිවරයාගේ හෝ ඒ හිටපු ජනාධිපතිවරයාගේ වැන්දඹුවගේ හෝ වාසය සඳහා උචිත නිවාසයක් නොසපයන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි ඒ හිටපු ජනාධිපතිවරයාට හෝ ඒ හිටපු ජනාධිපතිවරයාගේ වැන්දඹුවට හෝ ගෙවිය යුතු මාසික විශ්‍රාම වැටුපෙන් තුනෙන් එකකට සමාන මාසික දීමනාවක් ඒ හිටපු ජනාධිපතිවරයාට හෝ ඒ හිටපු ජනාධිපතිවරයාගේ වැන්දඹුවට හෝ ගෙවිය යුතු ය.

**ලේකම් දීමනා ගෙවීම සහ නිල ප්‍රවාහන සහ වෙනත් පහසුකම් සැලසීම.**

3. (1) (අ) ජනාධිපතිවරයාගේ පෞද්ගලික ලේකම් ධුරය දරන තැනැත්තාට තත්කාලයේ ගෙවනු ලබන මාසික වැටුපට සමාන මාසික ලේකම් දීමනාවක් සෑම හිටපු ජනාධිපතිවරයකුට ම ගෙවිය යුතු ය; තවද

(ආ) අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකුගේ පෞද්ගලික ලේකම් ධුරය දරන තැනැත්තකුට තත්කාලයේ ගෙවනු ලබන මාසික වැටුපට සමාන මාසික ලේකම් දීමනාවක් හිටපු ජනාධිපතිවරයකුගේ වැන්දඹුවට ගෙවිය යුතු ය.

(2) සෑම හිටපු ජනාධිපතිවරයකුට ම සහ සෑම හිටපු ජනාධිපතිවරයකුගේ වැන්දඹුවකට, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකුට තත්කාලයේ සපයනු ලබන නිල ප්‍රවාහන සහ වෙනත් සියලු පහසුකම් සලසනු ලැබිය යුතු ය.

**හිටපු ජනාධිපතිවරයකුගේ වැන්දඹුවට විශ්‍රාම වැටුප් ගෙවීම.**

4. හිටපු ජනාධිපතිවරයකු මියගිය අවස්ථාවේ දී ඔහුට ලැබීමට හිමිකම තිබූ හෝ ජනාධිපති ධුරය දැරීම නතර වූ අවස්ථාවේ දී ඒ හිටපු ජනාධිපතිවරයාට ලැබෙන්නට හිමිකම තිබූ, මාසික විශ්‍රාම වැටුපෙන් තුනෙන් දෙකකට සමාන මාසික විශ්‍රාම වැටුපක් ඒ හිටපු ජනාධිපතිවරයාගේ වැන්දඹුවට ඇගේ ජීවිත කාලය තුළ දී ගෙවිය යුතු ය.

9—ඒ 026183—6,730 (86/01)

ඒකාබද්ධ අරමුදලෙන් ගෙවීම.

5. මේ පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුප් සහ දීමනා ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු ය.

අර්ථ නිරූපණය.

6. මේ පනතෙහි —

"විශ්‍රාම වැටුප" යන්න හිටපු ජනාධිපතිවරයකු සම්බන්ධයෙන් යෙදුන විට ඒ හිටපු ජනාධිපතිවරයා ජනාධිපති ධූරය දරා තිබීමේ හේතුවෙන් ඔහුට ලැබීමට හිමිකම් ඇති විශ්‍රාම වැටුප එයින් අදහස් වේ;

"ජනාධිපතිවරයා" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා අදහස් වේ;

"වැන්දඹු" යන්නට වැන්දඹු පුරුෂයෙක් ද ඇතුළත් වේ.